# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1754 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திகதி<br>Date | 26/11/2024<br>පැය 1600 | | |

## මාධ්‍ය නිවේදනය

### 2024 උසස් පෙළ විභාගය පවත්වන කාලය තුල ඇතිවිය හැකි හදිසි ආපදා තත්වයන්ට මුහුණ දීම සම්බන්ධව - පොලිස් මූලස්ථානය

2024 නොවැම්බර් මස 25 වන දින සිට 2024 දෙසැම්බර් මස 20 වන දින දක්වා පැවැත්වෙන 2024 වසරේ අ.පො.ස. උසස් පෙළ විභාගය පැවැත්වෙන කාල සීමාවේදී යම් හදිසි ආපදා තත්ත්වයක් ඇති වුවහොත් එකී විභාග අපේක්ෂකයන්ට කිසිදු බාධාවකින් තොරව විභාගය සඳහා මුහුණ දීමට ක්‍රියා කල යුතු ආකාරය පිලිබඳව උපදෙස් ජාතික ආපදා කළමණාකරන මධ්‍යස්ථානය (DMC) මගින් නිකුත් කර ඇත.

එම උපදෙස් අනුව ක්‍රියාත්මක වීම සඳහා ජාතික ආපදා කළමණාකරන මධ්‍යස්ථානය (DMC) හා පොලිස් මූලස්ථානය සම්බන්ධීකරණය සඳහා පොලිස් නාවික කොට්ඨාසයේ අධ්‍යක්ෂවරයා පත්කර ඇති අතර, ප්‍රාදේශීය පොලිස් ස්ථානයන් හා ජාතික ආපදා කළමණාකරන මධ්‍යස්ථානය (DMC) සම්බන්ධීකරණය සඳහා සියලුම කොට්ඨාස භාර නිලධාරීන් පත්කර ඇත.

ඒ අනුව, 2024 අ.පො.ස. උසස් පෙළ විභාග මධ්‍යස්ථාන ආශ්‍රිතව මෙන්ම එම ස්ථාන වලට ගමන් ගන්නා මාර්ග වලට බාධාවන පරිදි ස්වභාවික ආපදා තත්ත්වයක්, අනතුරුදායක හෝ අවධානම් තත්ත්වයක් පවතින්නේද යන්න පිලිබඳව තොරතුරු පරික්ෂා කර බලා එවැනි තත්ත්වයක් ඇති වුවහොත් විභාග අපේක්ෂකයින්ට කිසිදු අවහිරයකින් තොරව විභාගයට පෙනී සිටීමට අවස්ථාව සැලසීම සඳහා අවශ්‍ය සම්පත් හා සේවා පිලිබඳව හදිසි අවස්ථා සම්බන්ධීකරණ කාර්යාල සහ ජාතික විභාග හදිසි අවස්ථා මෙහෙයුම් ඒකක පිහිටුවා ඇත.එමගින් අවශ්‍ය උපදෙස් සහ සහයෝගය ලබා ගෙන නිලධාරීන් යොදවා කඩිනමින් තත්ත්වය පාලනය කර නිසි පරිදි විභාගය පැවැත්වීමට සහයෝගය ලබා දිය යුතු බවට සියලුම පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇතුලු සියලුම ස්ථානාධිපතිවරුන් වෙත පොලිස් මූලස්ථානය මගින් දැනුම් දී ඇත.

තවද විභාගය පැවැත්වෙන කාල සීමාව තුල විභාග මධ්‍යස්ථානයන්හි ඇතිවිය හැකි ව්‍යසනයන් සඳහා කඩිනමින් ප්‍රතිචාර දැක්වීම හා විභාග කටයුතු අවසන් වන තෙක් අවශ්‍ය සහයෝගය ලබා දීමටත් විභාග මධ්‍යස්ථාන ආශ්‍රිතව අවශ්‍ය වුවහොත් මදුරු උවදුරු සඳහා දුමාරයන් හා පිරිසිදු කිරීමේ වැඩසටහන් විභාගයට බාධාවක් ඇති නොවන සේ වගකිව යුතු නිලධාරීන් සමග සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක කිරීමටත් වැඩිදුරටත් දන්වා ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**